# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ)

**දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව**
**සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අශෝක ප්‍රියන්ත මහතා විසින්
2021 අප්‍රේල් මස 06 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 මාර්තු මස 19 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[43 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල :** රු. 17.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ)

## දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී සභාවේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද;

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී සභාව සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2021 අංක     දරන දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" කිරීම යනුවෙන් හඳුන්වනු ලබන) දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිත කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බොදු පිළිවෙත් පුරණ නිවන් මග අරමුණ කර ගත් ප්‍රතිපත්ති පූජාවට මුල්තැන දී කටයුතු කරන ගිහි පැවිදි පිරිසක් බිහිකර ගැනීම;

(ආ) ධර්ම ඥානය උදෙසා දහම් ග්‍රන්ථ ඉදිරිපත් කිරීම හා නවක පිරිස් වෙනුවෙන් දෛනිකව සීල, සමාධි, ප්‍රඥා වැඩීම, ධර්ම සාකච්ඡා පැවැත්වීම හා ධර්ම අනුශාසනා ශ්‍රවණයට ඉඩ ප්‍රස්ථා සලසා දීම;

(ඇ) දහම් සභාවට අයත් වන ආයතනයන් හි, සිව්වනක් පිරිසගේ විනය ගරුත්වය උදෙසා දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ නාහිමියන් විසින් අනුදැන වදාළ කතිකාවත් සුරක්ෂිත කොට ක්‍රියාවේ යෙදවීම සඳහා පියවර ගැනීම;

(ඈ) ධර්ම අවබෝධයට ලැදි සිව්වනක් පිරිසගේ අවබෝධය දියුණු කර ගැනීම සඳහා උපකාර වන දහම් ග්‍රන්ථයක් වාර්ෂිකව ඉදිරිපත් කිරීමට පියවර ගැනීම හා ධර්මයේත්, විනයේත් ගැඹුරු අර්ථ ඇති තැන් අවබෝධය ඇති වැඩිහිටි භික්ෂූණ් වහන්සේලා විසින් නවක පැවිදි පිරිසට සහ දායක පිරිසට අවබෝධ කර දීමට පියවර ගැනීම;

(ඉ) බාල වයසේ පසුවන පිරිස වෙනුවෙන් ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා පහසුකම් සැලසීම;

(ඊ) ශ්‍රී සම්බෝධි ආරණ්‍ය සේනාසනවල සමානාත්මතාව ඇතිකොට සඟසතු සිව්පසය පැවිදි පිරිසගේ පරිහරණය හා පාරිභෝජනයට පමණක් යෙදවීමට කටයුතු කිරීම;

(උ) දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාවට අයත් ශ්‍රී සම්බෝධි ආරණ්‍ය සේනාසනවල හා සිව්වනක් පිරිසගේ පරමාර්ථ මුදුන් පත්කර ගැනීමට අවශ්‍ය හිතකර හා ආනුෂංගික වන වෙනත් කාර්යයන් ඉටු කිරීම;

(ඌ) දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව මගින් අනුමත කරගෙන ඇති ව්‍යවස්ථාවට අනනුකූලතාවයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම ;

(එ) ධර්ම විනය අවබෝධයෙන් යුතු, පස් පව් දස අකුසල්වලින් මිදී ආමිසයෙහි ආදීනව දුක ප්‍රතිපත්ති පූජාවට මුල්තැන දෙමින් ශ්‍රද්ධාවෙන් බොදු පිළිවෙත් පුරන නිවන පරමාර්ථ කරගත් පැවිදි සහ ගිහි දයක පිරිසක් බිහිකර ගැනීම. ඒ සඳහා මාසිකව සතර පෝයට සීල භාවනා වැඩසටහන් පැවැත්වීම, වාර්ෂික භාවනා සති පැවැත්වීම හා අවබෝධය දියුණු කරගත් පැවිදි පිරිස් අතර හා ගිහි පැවිදි පිරිස් අතරේ ධර්ම සාකච්ඡා ඇති කිරීම. ඒ තුළින් සිත දියුණු කර ගත් හේතුඵල කර්මඵල අවබෝධයෙන් යුතුව හැසිරෙන, හසුරවන ගිහි පැවිදි පිරිසක් ඇති කර ගැනීම;

(ඒ) දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ නාහිමියන් විසින් අවබෝධකර ඇති ධර්ම විනය ඇතුළත් ධර්ම ග්‍රන්ථ, කථිකාවත්, කැසට් පට, වීඩියෝ පට සුරක්ෂිත කොට නිතර පරිශීලනය කළ හැකි පරිදි සකසා දී කථිකාවත් ක්‍රියාවට නැංවීම, එමෙන්ම ධර්ම විනය පිළිබඳව ධර්ම සාකච්ඡා මගින් අවබෝධය ඇති වැඩිහිටි භික්ෂූන් වහන්සේලා විසින් නවක පැවිදි පිරිසට අවබෝධ කරදීම. ඒ තුළින් ධර්ම අවබෝධයෙන් හා විනයෙන් පරිපූර්ණ පැවිදි පිරිසක් බිහි කර ලීම;

(ඔ) බාල වයසේ පසුවන ගිහි පැවිදි පිරිස වෙනුවෙන් අධ්‍යාපන පහසුකම් සකස්කොට ගුණාත්මක දැනුමින්ද පෝෂණය වන භාවනා සති පවත්වා පොහොය දින සීල, භාවනා, ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා පවත්වා සිව්වනක් පිරිස තුළ බෞද්ධ චර්යා ධර්ම පදනම් කර ගත් ආජීව අෂ්ඨමක සීලය අනුගමනය කරන පිරිසක් බිහි කිරීම;

(ඕ) ධර්ම අවබෝධයට ලැදි පිළිවෙත් සුරකින යම් ප්‍රදේශයක දයක පිරිසක් සංවිධානය වන්නේ නම් එම ප්‍රදේශයේ නව ශාඛා සේනාසනයක් පිහිටුවීමට දයකත්වය දෙමින් ව්‍යාප්තිය ඇති කරලීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**4.** (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ තවත් නිලධාරීන් එකොළොස් දෙනකු සමන්විත වූ කළමනාකරණ සභාව මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම වූ කළමනාකරණ සභාව මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ සංවිධානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, අරමුදල් කර ගැනීමේ ද සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

දහම් සභාවේ අරමුදල

**6.** (1) දහම් සභාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් වියදම් කරන ලද සියලුම මුදල් අරමුදලින් ගෙවිය යුතු ය.

දහම් සභාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව

**7.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් අන්‍යාකාරයකින් පදනම වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව එකී දේපල විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපල අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතු වන්නේ ය.

දහම් සභාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

8. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ පදනමේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, පදනමේ පරමාර්ථවලට සමාන පරමර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙද දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

9. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එකී ආදායම සහ වියදම පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සෑම වර්ෂයක දීම යටත් පිරිසෙයින් එක් වරක්වත්, සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර, සංස්ථාවේ ආදායම සහ වියදම, ගිණුම් සහ ශේෂ පත්‍රවල නිරවද්‍යතාව කළමනාකාර කමිටුව විසින් පත් කරනු ලබන සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

*දහම් සභාවේ මුද්‍රාව*

**10.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් විසින් ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම*

**11.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.